# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය විසින්
2017 දෙසැම්බර් මස 04 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 නොවැම්බර් මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[222 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010515—510 (2017/12)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තකු නියෝජනය කරනු ලබන නීතිඥවරයකුගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන කාලසීමාවේ, එක් දීර්ඝ කිරීමක සම්පූර්ණ කාලය අවුරුදු හතරකට වැඩි නොවන සේ විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ "නීතිපතිවරයා", "සංඥෙය වරද" සහ "පොලිස් ස්ථානය භාර නිලධරයා" යන යෙදුම් අර්ථ දැක්වීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 47/2017.

**2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක     දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් හඳුන්වනු ලබන) 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය, ඒ පනතේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— 2013 අංක 2 දරන පනතට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශ වීමට නීතිඥවරයකුට ඇති අයිතිය.

6අ. (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු නියෝජනය කරන නීතිඥවරයකුට, ඒ තැනැත්තා අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ සිට මේ වගන්තියේ නියම කර ඇති කාර්ය සඳහා ඒ තැනැත්තා අත්අඩංගුවේ රඳවා සිටින පොලිස් ස්ථානයට ප්‍රවේශ වීමට හිමිකම තිබිය යුතු ය.

(2) පොලිස් ස්ථානයට ප්‍රවේශ වීමට සහ කරුණු දැක්වීමට නීතිඥවරයකුට ඇති අයිතිය, නීතිඥවරයා විසින් නියෝජනය කරනු ලබන තැනැත්තා සම්බන්ධයෙන් පවත්වනු ලැබිය හැකි විමර්ශන කටයුතු කෙරෙහි බලපෑමක් ඇති නොකළ යුතු ය.

(3) එවැනි යම් නීතිඥවරයකුට, ඒ පොලිස් ස්ථානයට ඇතුළු වීමට අවසර දෙනු ලැබිය යුතු අතර, ඒ පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් නිලධරයන් විසින් ඔහුට සුහදව සහ ආචාරශීලීව සලකනු ලැබීමත් සාධාරණ ලෙස සහ ඉවසීමෙන් යුතුව සවන් දීමත් කළ යුතු ය.

(4) එවැනි යම් නීතිඥවරයකුට, පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තා වෙනුවෙන්,

පොලිස් ස්ථානය භාර නිලධරයා හමු වී පහත දැක්වෙන තොරතුරු සනාථ කර ගැනීමට හිමිකම ඇත්තේ ය:—

(අ) ඒ තැනැත්තා විසින් කරන ලදැයි කියනු ලබන වරද කවරක් ද යන්න;

(ආ) ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබූ දිනය, වේලාව සහ ස්ථානය;

(ඇ) ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවනු ලබන දිනය, ආසන්න වශයෙන් වේලාව සහ ස්ථානය; සහ

(ඈ) හෙළිදරවු කිරීම මගින්, වැඩිදුර විමර්ශන පැවැත්වීම කෙරෙහි සහ යුක්තිය ඉටු කිරීම කෙරෙහි හානිකර බලපෑමක් ඇති කරනු නොලබන වෙනත් යම් තොරතුරු.

(5) එවැනි යම් නීතිඥවරයකුට-

(අ) පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තා වෙනුවෙන්, ඔහු නියෝජනය කරමින් පොලිස් ස්ථානය භාර නිලධරයාට කරුණු දැක්වීමට;

(ආ) 1997 අංක 30 දරන ඇප පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, ඒ තැනැත්තා වෙනුවෙන් ඇප ලබා ගැනීම සඳහා, පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට; සහ

(ඇ) (6), (7), (8), (9), සහ (10) යන උපවගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි, අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තා වෙත ප්‍රවේශ වීමට,

හිමිකම තිබිය යුතු ය.

(6) යම් නීතිඥවරයකු ඉල්ලා සිටින්නේ නම්, ඔහුට අත්අඩංගුවේ සිටින තැනැත්තා වෙත ප්‍රවේශවීමට ඉඩ ලබා දිය යුතු ය. කෙසේ වුව ද, පොලිස්

අත්අඩංගුවේ සිටින තැනැත්තා විසින් එම ප්‍රවේශ අයිතිය ක්‍රියාවේ යෙදවීමට අපේක්ෂා කරන අවස්ථාවේ දී––

(අ) සංඥෙය වරදක් සිදු කිරීම සම්බන්ධව ඇති සාක්ෂි විනාශ කිරීමට, සාක්ෂිවලට බලපෑම් කිරීමට හෝ හානි කිරීමට මග සලසන බවට හෝ එම වරද සිදු කිරීමට අදාළව කරුණු සහ සිදුවීම් දන්නා වෙනත් තැනැත්තන්ට බලපෑම් කිරීමට, තර්ජනය කිරීමට හෝ පීඩා කිරීමට හේතුවන බවට; හෝ

(ආ) ඒ සංඥෙය වරද සිදු කර ඇති හෝ එවැනි සංඥෙය වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති හෝ එම වරදෙහි ක්‍රියාදාමය අතරතුර දීම වෙනත් වැරදි සිදු කරන ලද නමුත් අත්අඩංගුවට ගෙන නොමැති වෙනත් තැනැත්තන්ට සෝදිසියෙන් සිටීමට මග සලසන බවට; හෝ

(ඇ) සංඥෙය වරදක් සිදුකිරීමෙන් අත්පත් කරගන්නා ලද යම් දේපළක් හෝ එහි වටිනාකම හෝ ඉන් කොටසක් හඳුනාගැනීම වළක්වන බවට, එහි පිහිටීම සඟවන බවට හෝ එය සොයා ගැනීමට බාධා කරන බවට; හෝ

(ඈ) එවැනි සංඥෙය වරදක් සිදු කිරීම සඳහා භාවිත කරන ලද යම් ආයුධයක් හෝ වෙනත් මෙවලම් හඳුනා ගැනීම වළක්වන බවට, එහි පිහිටීම සඟවන බවට හෝ එය සොයා ගැනීමට බාධා කරන බවට,

විශ්වාස කිරීමට පොලිස් ස්ථානය භාර නිලධරයාට සාධාරණ හේතු පවතී නම් අත්අඩංගුවේ සිටින තැනැත්තා වෙත ප්‍රවේශයට ඉඩ ලබා දීම ප්‍රමාද කරනු ලැබිය හැකි ය.

(7) සෑම අවස්ථාවකම, පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවීමට

නීතිය මගින් විධිවිධාන සලසා ඇති කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව, නීතිඥවරයකුට පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තා වෙත ප්‍රවේශවීමට ඉඩ ලබා දිය යුතු ය.

(8) ඉහත වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි ප්‍රවේශය ප්‍රමාද කිරීමේ තීරණය පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු විසින් නැවත සලකා බලනු ලැබිය හැකි අතර, එසේ නැවත සලකා බැලීමෙන් පසු එම නිලධරයාගේ තීරණය, එම තැනැත්තා අත්අඩංගුවේ තබන ලද පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(9) පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශවීමට ඉඩ ලද නීතිඥවරයකු විසින්, එම ප්‍රවේශය වගකීමෙන් යුතු ව සහ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු අතර, සාධාරණ ලෙස අවශ්‍ය වන කාලය ඉක්මවන පරිදි අනවශ්‍ය ලෙස හෝ අසාධාරණ ලෙස ප්‍රවේශ කාලය දීර්ඝ නොකළ යුතු ය.

(10) පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශවීමට ඉඩ ලද නීතිඥවරයකුට, එම තැනැත්තා ප්‍රශ්න කිරීමට භාජනය කරන අවස්ථාවේ දී සහ ඔහුගේ ප්‍රකාශ සටහන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීමට හිමිකම නොතිබිය යුතු ය.

(11) එම නීතිඥවරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ කරුණු දක්වනු ලබන හෝ ඉල්ලීමක ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්-

(අ) එසේ කරන ලද කරුණු දැක්වීම වාර්තාගත කළ යුතු ය;

(ආ) ඒ කරුණු දැක්වීමට නිසි සැලකිල්ල දැක්විය යුතු ය; සහ

(ඇ) ඇප ඉල්ලීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු වාර්තාගත කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ “අවුරුදු දෙකක්” යන වචන වෙනුවට “අවුරුදු හතරක්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

“අර්ථ නිරූපණය.

8අ. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, “නීතිපතිවරයා”, “සංඥෙය වරද” සහ “පොලිස් ස්ථානය භාර නිලධරයා” යන යෙදුම් සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ එම යෙදුම්වලට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.